NSW Health

# NSW හි ස්වේච්ඡාවෙන් මියයාමට උපකාර කිරීම

**Voluntary assisted dying in NSW** — **Sinhalese**

NSW හි ස්වේච්ඡාවෙන් මියයාමට උපකාර කිරීමේ ක්‍රියාවලියේ **පියවර 11** ක් ඇත. ඕනෑම පියවරකදී ඔබට මෙම ක්‍රියාවලිය තාවකාලිකව අත්හිටුවීම හෝ නැවැත්වීම සිදු කල හැක.

| | |
|---|---|
| **පියවර 1** | ස්වේච්ඡාවෙන් මියයාමට උපකාර කිරීම සඳහා ඔබ විසින් වෛද්‍යවරයාට **පළමු ඉල්ලීම** ඉදිරිපත් කිරීම |
| **පියවර 2** | සම්බන්ධීකාරක වෛද්‍යවරයා විසින් **පළමු ඇගයීම** සම්පූර්ණ කිරීම |
| **පියවර 3** | තවත් වෛද්‍යවරයෙකු විසින් **උපදේශාත්මක ඇගයීමක්** සම්පූර්ණ කිරීම |
| **පියවර 4** | ඔබ විසින් **ලිඛිත ප්‍රකාශනයක්** සම්පූර්ණ කිරීම |
| **පියවර 5** | ඔබ විසින් ස්වේච්ඡාවෙන් මියයාමට උපකාර ලබා ගැනීම සඳහා **අවසාන ඉල්ලීමක්** ඉදිරිපත් කිරීම |
| **පියවර 6** | ඔබගේ සම්බන්ධීකාරක වෛද්‍යවරයා විසින් **අවසාන සමාලෝචනයක්** සම්පූර්ණ කිරීම |
| **පියවර 7** | ඔබගේ වෛද්‍යවරයාගේ උපකාර ඇතිව **බෙහෙත් ලබා ගන්නා ආකාරය** සම්බන්ධයෙන් ඔබ විසින් තීරණයක් ගැනීම |
| **පියවර 8** | ඔබගේ වෛද්‍යවරයා විසින් **බෙහෙත් ලබාදීමේ අවසරයක්** සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කිරීම. ස්වේච්ඡාවෙන් මියයාමට උපකාර කිරීමේ මණ්ඩලය විසින් අනුමැතිය ලබාදීම |
| **පියවර 9** | ඔබගේ වෛද්‍යවරයා විසින් **බෙහෙත් නියම කිරීම** |
| **පියවර 10** | ඔබ තීරණය කලහොත් එම අවස්ථාවේ ඔබ බෙහෙත් ලබා ගැනීම හෝ ඔබට **බෙහෙත්** ලබාදීම |
| **පියවර 11** | **මරණ සහතිකයක්** නිකුත් කිරීම |

## NSW හි ස්වේච්ඡාවෙන් මියයාමට උපකාර කිරීම සම්බන්ධ නැවිගේටර් සේවාව

යනු ස්වේච්ඡාවෙන් මියයාමට උපකාර කිරීම සම්බන්ධ දුරකථන මාර්ගයකි.

සේවාව මගින් රෝගීන් සහ පවුලේ අය ඇතුළු සැම දෙනා හට උපකාර කරයි.

සඳුදා සිට සිකුරාදා දක්වා පෙව 8.30 සිට පව 4.30 දක්වා දුරකථන අංක **1300 802 133** අමතන්න.

මෙය Voluntary Assisted Dying Act 2022 (2022 ස්වේච්ඡාවෙන් මියයාමට උපකාර කිරීම පනතේ) ස්වේච්ඡාවෙන් මියයාමට උපකාර කිරීමේ ක්‍රියාවලියේ පියවර සම්බන්ධ සාරාංශයකි. මෙම සාරාංශය මගින් රෝගියෙකුගේ ස්වේච්ඡාවෙන් මියයාමට උපකාර කිරීමේ ක්‍රියාවලියේ ඇතිවිය හැකි සෑම අවස්ථාවක්ම ආවරණය නොකරන අතර දළ අදහසක් පමණක් ලබාදෙයි.